සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

## නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන "අදිති"

12

පැය 01 යි

විභාග අංකය ................................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. 1-40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරන්න.**

1. රෝහලක නිතරම ඇත්තේ

(1) රෝගීන් (2) වෛද්‍යවරුන් (3) ඇඳන්

2. නැන්දා අනිවාර්යයෙන් ම


(1) වැඩිමහල් අයෙකි (2) කාන්තාවකි (3) පියාගේ සහෝදරියකි

3.කවියේ හිස්තැනට සුදුසු වචනය වනුයේ

සොඳුරු සැප වේවා
උතුරු ගුණ වැඩි වේවා
මහරු බල වේවා
මෙදරු පෙළ හට .................. වේවා


(1) හොඳක් (2) ජයක් (3) යසක්

4. රටාව අනුව හිස්තැනට ආ යුතු පිළිතුර තෝරන්න





(1) 12 (2) 4 (3) 7

5.




(1) 12 (2) 14 (3) 16

6. මෙම රූපයේ සෘජුකෝණාස්‍ර කීය ද ?



(1) 60 (2) 48 (3) 62


7. 1 සිට 21 දක්වා රෝම සංඛ්‍යා ලිවීමේ දී **X** සංකේතය ලියවෙන වාර ගණන කීය ද ?




(1) 11 (2) 12 (3) 14

8. පන්තියක සිසුන් සියලු දෙනා පෙළගස්වා ඔවුන් සියලු දෙනාට ම අනුපිළිවෙළින් අංක ලබා දී තිබුණි. පන්තියේ ගුරුතුමිය පැමිණ අනුපිළිවෙළින් සිටි සිසුන් 6 දෙනෙකු යොදාගෙන කණ්ඩායමක් සෑදුවා ය. ඔවුන් 6 දෙනාට ලබා දී තිබුණු අංකවල එකතුව වී තිබුණේ 63 ය. එසේ නම් එම කණ්ඩායමේ අය අතරින් මුලින් ම සිටි සිසුවාගේත් අවසානයට ම සිටි සිසුවාගේත් අංක දෙක පිළිවෙළින් ඇත්තේ

(1) 8, 14 (2) 8, 15 (3) 8, 13

9. හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.




(1)  (2)  (3) 

10. A , B , C ලෙස ලකුණු කරන ලද කණු 3කි. A කණුවේ කුරුල්ලන් 15ක් වසා සිටින අතර B කණුවේ කුරුල්ලන් 9 දෙනෙක් වසා සිටිති. C කණුවේ දැනට එක් කුරුල්ලෙක්වත් නැත. A හා B කණු දෙකෙන් යම් කුරුල්ලන් සංඛ්‍යාවක් C කණුවට පියාඹා ආ විට කණු තුනෙහිම සිටින කුරුල්ලන් ගණන සමාන වේ. එසේ සමාන වීමට A කණුවෙන් C කණුවට පියාඹා යායුතු කුරුල්ලන් ගණන කීය ද ?

(1) 8 (2) 7 (3) 9

11. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) 78 + 17 + 141 + 395 = 632

(2) 306 + 267 + 20 + 216 = 807

(3) 104 + 57 + 345 + 77 = 583

12. B + D = 7





B – D = 1 නම්,

B හි අගය කීය ද ? (1) 5 (2) 4 (3) 6



13. B × D = .........

(1) 11 (2) 12 (3) 10



● සංකේතවලට වචන ආදේශ කර ඇති ආකාරය පහත දැක්වේ.

 නංගී,  මල්ලී,  පාරට,  නිවසට,  යනවා,  එනවා

14. මල්ලී පාරට එනවා.

(1)  (2)  (3) 


15. නංගී නිවසට යනවා.

(1)  (2)  (3) 

16. කොන්ක්‍රීට් මිශ්‍රණයක් සාදා තිබුණේ සිමෙන්ති, වැලි, ගල් 1:2:3 අනුපාතයට ය. එම කොන්ක්‍රීට් මිශ්‍රණයේ තාච්චි ගණන 60ක් නම් එයට යොදා ඇති ගල් තාච්චි ගණන කීය ද ?

(1) 10 (2) 20 (3) 30

17. පහත රූපයේ ප්ලාස්ටික් යොදා සෑදූ උපකරණ කීයක් දැක්වේ ද ?




(1) 22 (2) 10 (3) 12

18. සිරිල් ගමේ කාටත් කරදරයක් වූ පුද්ගලයෙකි. තවත් එවැනි ම පුද්ගලයෙක් වූ ඇන්ටනී ද මෑතක සිට සිරිල් සමග එකතුවී සිටියි. මේ දෙදෙනාගේ එකතුවීම ගම්වැසියන් හඳුන්වන්නේ

(1)ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වාගෙයි

(2) කොහොඹ ගහට කරවිල වැල ගියා වගෙයි

(3) අබරා සිල් ගත්තා වාගෙයි

19. ලොකු මාමා 2022 පෙබරවාරි 7 සඳුදා දින අපේ නිවසට ආවේ ය. ඔහු අපේ නිවසේ දින 28ක් සිටියේ නම් ඔහු අපේ ගෙදර අන්තිමට ම සිටියේ

(1) මාර්තු 5 ඉරිදා (2) මාර්තු 6 ඉරිදා (3) මාර්තු 6 සඳුදා

20. චතුරිකා ළමා කතා පොතක 12 පිටුවෙන් පටන්ගෙන එක දිගට කියවාගෙන ගොස් 27 පිටුව ද කියවා අවසන් කළා ය. ඈ කියවූ පිටු ගණන කීය ද ?

(1) 15 (2) 16 (3) 39

21. නිවසක් සෑදීමට ගෙනා ගඩොල් කැට 187ක් එක් තැනක සිට තවත් තැනකට ගෙනයාමට සිදුවිය. මිනිසෙකුට එක් වතාවක දී ගෙන යා හැක්කේ ගඩොල් 5ක් පමණි. ගඩොල් ගොඩ ඇදීමට එක් මිනිසෙකු කී වතාවක් ගඩොල් ගෙන යායුතු ද ?

(1) 39 වතාවක් (2) 38 වතාවක් (3) 37 වතාවක්

22. සමචතුරස්‍රයක එක් පාදයක දිග7cmකි. එවැනි ම සමචතුරස්‍ර 4ක් එකිනෙක යා කරමින් සාදා ගත් සෘජුකෝණාස්‍රයක වටේ දිග කොපමණ ද ?

(1) 70cm (2) 112cm (3) 28cm

23. මුහුණ බලන කණ්ණාඩියකින් බලන විට වෙනස් නොවන අකුරු කට්ටලය තෝරන්න.

(1) MCHZA (2) EUHWX (3) HUMAV

24. පියවරුන් දෙදෙනෙකු සහ පුතුන් දෙදෙනෙකු බංකුවක වාඩිවී සිටි අතර තිදෙනා ම තේ පානය කරමින් සිටියෝ ය. මෙම ප්‍රකාශය

(1) සත්‍ය වේ (2) අසත්‍ය වේ (3) කිව නොහැක

25. ත්‍රීරෝද රථයක මුල් 10km සඳහා කිලෝමීටරයකට රු.25.00 බැගින් ද, ඉන් අනතුරුව සෑම කිලෝමීටරයකට ම රු.15.00 බැගින් ද අය කෙරේ. 29km දුර ගමනක් ගිය අයෙකු ත්‍රීරෝද රථයට ගෙවිය යුතු මුදල කීය ද ?

(1) රු. 535.00 (2) රු. 265.00 (3) රු. 435.00

26. ත්‍රිකෝණාකාර රටාවක් ලැබෙන පරිදි සබන් කැට අසුරා තිබුණි. එහි යට ම පේළියේ සබන් කැට 10ක් තිබුණේ නම් එහි තිබුණු මුළු සබන් කැට ගණන කීය ද ?

(1) 49 (2) 55 (3) 50

27. මනුත් 2012 වර්ෂයේ උපන්නේනෙකි. එම වර්ෂය අයත් සියවස හා දශකය තෝරන්න

(1) 21 සියවස 2 දශකය (2) 22 සියවස 2 දශකය (3) 21 සියවස 1 දශකය

28. සංඛ්‍යාවක් සිතාගෙන එය 4න් ගුණකර ලැබෙන පිළිතුරට 5ක් එකතුකර නැවත දෙකක් අඩු කළවිට ලැබුණු පිළිතුර 31ක් වූයේ නම් මුලින් සිතූ සංඛ්‍යාව කීය ද ?

(1) 7 (2) 8 (3) 6

29. රූපවාහිනියක වටිනාකමින් $\frac{2}{3}$ක මුදලක් මා සතුව ඇත. ඉතිරි මුදල මිතුරන් තිදෙනෙකුගෙන් රු.500 බැගින් ඉල්ලාගෙන රූපවාහිනිය මිල දී ගතිමි. රූපවාහිනියේ වටිනාකම කීය ද ?

(1) රු. 5500 (2) රු. 7500 (3) රු. 4500

30. ළමයෙක් බස්නාහිරට මීටර් පහළොවක් ගමන් කර එතැනින් උතුරු දිශාවට මීටර් දහයක් ද ගමන් කළේ ය. ඔහු තවත් මීටර් පහළොවක් නැගෙනහිර දිශාවට ගොස් නතරවිය. දැන් ඔහු සිටින්නේ ආරම්භක ස්ථානයේ සිට කොපමණ දුරකින් ද ?

(1) 40m (2) 15m (3) 10m

31. මගේ අම්මා රුවිනිගේ ලොකු අම්මා ය. රුවිනිගේ අම්මා මගේ අම්මාගේ කවුද ?

(1) පුංචි අම්මා (2) නංගි (3) අක්කා

32. මේ අතරින් වැරදි ප්‍රකාශය තෝරන්න

(1) ඔත්තේ සංඛ්‍යා දෙකක එකතුව හැමවිට ම ඉරට්ටේ සංඛ්‍යාවකි

(2) ඉරට්ටේ සංඛ්‍යා දෙකක එකතුව හැමවිට ම ඔත්තේ සංඛ්‍යාවකි

(3) ඉරට්ටේ සංඛ්‍යා දෙකක එකතුව හැමවිට ම ඉරට්ටේ සංඛ්‍යාවකි

33. දිග කම්බියක් ස්ථාන තුනකින් කපා ඇත්තේ සමාන දිග ලැබෙන ලෙසයි. එසේ කැපූ එක් කුඩා කැබැල්ලක දිග 1m 55cmකි. කෑලි කැපීමට පෙර කම්බියේ දිග කොපමණ ද ?

(1) 4m 65cm (2) 5m 35cm (3) 6m 20cm

34. පොල් - ගෙඩි නම්, සියඹලා - ........................

(1) කරල් (2) අල (3) ඇඹුල්

35. අවස්ථා නිවැරදිව පෙළගස්වා ඇති පිළිතුර කුමක් ද ?

(1) බීජය ⟶ පැළය ⟶ ගස

(2) ළමයා ⟶ ළදරුවා ⟶ තරුණයා

(3) පිටි ⟶ හාල් ⟶ කැවුම්


36. ඉන්ධන ලීටර එකකින් 14kmක දුරක් ගොස් ආපසු ඒමට හැකිය. එම මෝටර් රථයට ඉන්ධන ලීටර් 2ක් යොදා කොපමණ දුරක් යා හැකි ද ?

(1) 14 km (2) 28 km (3) 56 km


37. නිවසක පෙ.ව.9.45 සිට පෙ.ව.10.15 දක්වා රූපවාහිනියත්, පෙ.ව.9.10 සිට පෙ.ව.9.50 දක්වා ගුවන් විදුලි යන්ත්‍රයත්, පෙ.ව.9.40 සිට පෙ.ව.10.40 දක්වා වතුර පොම්පයත් ක්‍රියාත්මකව තිබුණි. උපකරණ තුන ම එකවර ක්‍රියාත්මක ව තිබූ කාලය කොපමණ ද ?

(1) මිනිත්තු 15 (2) මිනිත්තු 5 (3) මිනිත්තු 10

● රූප සටහනට අනුව නිවැරදි පිළිතුර තෝරන්න.



රු. 380.00



රු. 460.00

38. අන්නාසි ගෙඩි 4ක් සහ දොඩම් ගෙඩි 2ක් ගැනීමට අවශ්‍ය මුදල කීය ද ?

(1) රු. 760.00 (2) රු. 840.00 (3) රු. 570.00

39. දොඩම් ගෙඩි 5ක් ගැනීමට අවශ්‍ය මුදල කීය ද ?

(1) රු. 700.00 (2) රු. 350.00 (3) රු. 400.00

40. විදුලි බුබුළු වැලක රතු, සුදු, කහ පිළිවෙළින් විදුලි බුබුළු අමුණා තිබුණි. එහි අවසන් විදුලි බුබුළ රතු පාට එකකි. රතු පාට විදුලි බුබුළු 6ක් තිබූ එහි වූ මුළු විදුලි බුබුළු ගණන කීය ද ?

(1) 16 (2) 19 (3) 18